# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,203 — 1960 සැප්තැම්බර් 19 වැනි සඳුද — 19.9.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 393**

**අ.ආ.කා. අංකය : C 244/60.**

මුදල් ඇමති, ගරු ෆ්ලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, දිවයිනට පෙරළා පැමිණෙන තුරු, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, ගරු මුදල් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, ජෝජ් රාජපක්ෂ, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1960 සැප්තැම්බර 19 වැනි දින සිට, මුදල් ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 සැප්තැම්බර 19 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී.

9344.

---

**1960 අංක 394**

**අ. ආ. කා. අංකය : C 244/60.**

සෞඛ්‍ය ඇමති, සෙනෙට් සභික ගරු ඒ. පී. ජයසූරිය මහතා, දිවයිනට පෙරළා පැමිණෙන තුරු වැඩ බලන සෞඛ්‍ය ඇමති, ගරු ජේ. පී. ඔබේසේකර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වෙනුවට, 1946යේ හා 1947තේ (ලංකා ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, කම්කරු හා ජනසතුසේවා පිළිබඳ ඇමති, ඔ.බී.ඊ. නාමධාරී, සෙනෙට් සභික ගරු සී. විජේසිංහ මහතා, තම රාජකාරිවලට අතිරේකව, 1960 සැප්තැම්බර 19 වැනි දින සිට, සෞඛ්‍ය ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන් ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 සැප්තැම්බර 19 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී.

9381


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

891—ජේ. ඇන්. ආර් 12064—4,225 (9/60)